# ගණිතය

## පළමුවන ශ්‍රේණිය

### තුන්වන වාරය

<u>ගුරු මාර්ගෝපදේශයට අනුව සම්පාදිතයි</u>

**සැකසුම : බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**



# සංඛ්‍යාවකට පෙර සංඛ්‍යාව හා පසු සංඛ්‍යාව හඳුනා ගැනීම



**ක්‍රියාකාරකම 01 -** පෙර හා පසු හඳුනා ගනිමු.

**සපයා ගත යුතු දේ -**

- පළමුවෙනියා, දෙවෙනියා ...... හඳුන්වාදීම සඳහා යොදාගත් සතුන්ගේ ආකෘති නැවත භාවිත කරන්න.
- අපතේ යන හිස් පෙට්ටිවලින් ( පිටි පෙට්ටි , සබන් පෙට්ටි) කපා ගත් දිග, පළල අඟල් 2ක ප්‍රමාණයේ කාඩ්පත්වල 1-9 තෙක් ඉලක්කම් ලියා ගන්න.

| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |
|---|---|---|---|---|---|---|---|---|

**ක්‍රියාකාරකම 01** - පෙර හා පසු ස්ථාන හඳුනා ගනිමු.

- හාවා, පූසා, තාරාවා යන ආකෘති තුන එකම දිශාවට පේළියට තබන්න.
- පහත පරිදි දරුවාගෙන් ප්‍රශ්න අහන්න .
  - ✓ ඉදිරියෙන් සිටින සතා කවු ද ?
  - ✓ මැදින් සිටින සතා කවු ද ?
  - ✓ පිටුපසින් සිටින සතා කවු ද ?
- පූසාට පෙර හාවා සිටින බවත් පූසාට පසු තාරාවා සිටින බවත් දරුවාට කියාදෙන්න .
- පෙර පසු සිටින අය සතුන්ගේ ආකෘති වෙනස් කරමින් තවදුරටත් අහන්න .

**ක්‍රියාකාරකම 02 -** පෙර සංඛ්‍යා සොයමු

**දෙමාපියන්ට උපදෙස් -**

- සකස් කරගත් සංඛ්‍යා කාඩ් තුනක් ගන්න.
- ඒවා පේළියට තබන්න.
- මැද  සංඛ්‍යාව පෙන්වීමට දරුවාට කියන්න.
- මැද සංඛ්‍යාවට පෙර සංඛ්‍යාව පෙන්වීමට කියන්න.
- මැද සංඛ්‍යාවට පසු සංඛ්‍යාව පෙන්වීමට කියන්න.
- නැවත වෙනත් සංඛ්‍යා තුනක් ගන්න.
- එම සංඛ්‍යා ද පේළියට තබන්න.
  - ✓ මැද සංඛ්‍යාවට පෙර සංඛ්‍යාව කුමක් ද ?
  - ✓ මැද සංඛ්‍යාවට පසු සංඛ්‍යාව කුමක් ද?

**ක්‍රියාකාරකම 03 –**

- සකස් කරගත් සංඛ්‍යා කාඩ්පත් අතරින් එකක් තෝරා ගැනීමට දරුවාට කියන්න.
- එය මේසය මත තැබීමට කියන්න.
- එයට පෙර සංඛ්‍යාව ඉතුරු සංඛ්‍යා කාඩ්පත් අතරින් තෝරා ඉදිරියෙන් තැබීමට කියන්න
- එයට පසු සංඛ්‍යාව ද ඉතුරු කාඩ්පත් අතරින් තෝරා පිටුපසින් තැබීමට කියන්න.
- මේ ආකාරයට තෝරාගත් ඒ ඒ සංඛ්‍යා කාඩ්පත සඳහා පෙර හා පසු සංඛ්‍යා කාඩ්පත් තෝරා තැබීමට තවදුරටත් දරුවාට කියන්න.

**ක්‍රියාකාරකම 04 -**

- කලින් සකස් කරගත් සංඛ්‍යා කාඩ් නවය ම අනුපිළිවෙළට තබන්න .

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 | 7 | 8 | 9 |

- එහි දරුවා කැමති සංඛ්‍යාවක් පෙන්වීමට කියන්න..
- පෙන් වූ සංඛ්‍යාවට පෙර හා පසු සංඛ්‍යාව විමසන්න.
- පහත ප්‍රශ්නවලට සංඛ්‍යා පේළිය ඇසුරින් පිළිතුරු ලබා ගන්න.

✓ 4 ට පෙර සංඛ්‍යාව හා පසු සංඛ්‍යාව කියන්න.
✓ 6 ට පෙර සංඛ්‍යාව හා පසු සංඛ්‍යාව කියන්න.
✓ 7 ට පෙර සංඛ්‍යාව හා පසු සංඛ්‍යාව කියන්න.
✓ 8 ට පෙර සංඛ්‍යාව හා පසු සංඛ්‍යාව කියන්න.
✓ 2 ට පෙර සංඛ්‍යාව හා පසු සංඛ්‍යාව කියන්න.

---

*ගණිතය වැඩ පොතේ පිටු අංක 59,60,61 හි ඇති අභ්‍යාස කිරීම සඳහා මඟ පෙන්වන්න.*

---